UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

**පූර්ණ කාලීන ස්ථිර පදනම මත**

1. විශේෂඥ වෛද්‍ය නිලධාරි තනතුර
   I. කායික වෛද්‍ය විශේෂඥ තනතුර
2. වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී තනතුර
3. ඖෂධවේදී තනතුර
4. අක්ෂි තාක්ෂණවේදී තනතුර
5. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර
6. ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුර
7. කළමනාකරණ සහකාර තනතුර
8. කාර්මික ශිල්පී (ශල්‍යාගාර) තනතුර
9. මධ්‍ය වන්ධ්‍යකෘත ඒකක ක්‍රියාකරු තනතුර
10. දන්ත සහායක තනතුර
11. විද්‍යාගාර සහායක තනතුර

නිසි අයුරින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2026.07.19** වන දින හෝ එම දිනට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න. **www.kdu.ac.lk** / දුරකථන අංකය : **011-2044555**.

# www.kdu.ac.lk

SELACINE

UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ

**පූර්ණ කාලීන - ස්ථිර පදනම මත**

## 1. විශේෂඥ වෛද්‍ය නිලධාරි තනතුර

### 1. කායික වෛද්‍ය විශේෂඥ තනතුර

**සුදුසුකම්:**

I. 2018 අංක 28 දරණ වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධරයෙකු වීම.

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධරයෙකු වීම.

සහ

III. විශේෂඥ වෛද්‍ය (MD/ MS) උපාධිය සමග කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ I වන පරිශිෂ්ටය).

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MC 1-2 - රු.(161,140 - 12 × 4,850 - 219,340).

*MC 1-2 පියවර 01 හි (රු.161,140/-) තබනු ලැබේ.

## 2. වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී තනතුර - III ශ්‍රේණිය

**සුදුසුකම්:**

I. සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුලු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෛද්‍ය රසායනාගාරවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

IV. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දැ අවුරුදු පූර්ණ කාලීන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

V. වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

VI. විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී යෙකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 - රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900)

*MT 6 පියවර 01 හි (රු.55,110/-) තබනු ලැබේ.

## 3. ඖෂධවේදී තනතුර - III ශ්‍රේණිය

**සුදුසුකම්:**

I. සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුලුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමත් වීම.

සහ

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ ඖෂධවේදී/ විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම.

හෝ

IV. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන ඖෂධවේදී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

V. ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

VI. විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් ඖෂධවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 - රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900)

*MT 6 පියවර 01 හි (රු.55,110/-) තබනු ලැබේ.

## 4. අක්ෂි තාක්ෂණවේදී තනතුර - III ශ්‍රේණිය

**සුදුසුකම්:**

I. සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

III. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන අක්ෂි තාක්ෂණවේදී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

IV. අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

V. විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 රු. (55,110 – (10 x 800 – 11 x1190 – 10 x 1320 - 10 x 1350 – 102,900)
*MT 6 පියවර 01 හි (රු.55,110/-) තබනු ලැබේ.

## 5. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර - III ශ්‍රේණිය

**සුදුසුකම්:**

I. සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනක් එක්වරකදී සමත් වීම.

සහ

III. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි තනතුරෙහි කාර්යභාරයට අදාලව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වසර එකහමාරක (1 1/2) පූර්ණ කාලීන වෘත්තිමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

සහ

IV. කාන්තා පක්ෂයට පමණක් අයදුම් කළ හැක.

**වයස් සීමාව:**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 5 රු. (54,310 – 10 x 800 – 11 x 1,190 – 10 x 1,320 – 10 x 1,350 - 102,100)
*MT 5 පියවර 01 හි (රු.54,310/-) තබනු ලැබේ.

## 6. ශ්‍රවණවේදී කාර්මික ශිල්පී තනතුර

**සුදුසුකම්:**

I. ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකය 5 මට්ටමට (Level 5) නොඅඩු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන පූර්ණකාලීන අවුරුදු දෙකක (02) න්‍යායාත්මක හා සීමාවාසික ශ්‍රවණවේදී කාර්මික ශිල්පී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම

සහ

II. ශ්‍රවණවේදී කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MA 2-1 රු. (50,540 – (10 x 540 – 7 x 630 – 4 x 890 - 20 x 1,190 – 87,710)

*MA 2-1 පියවර 01 හි (රු.50,540/-) තබනු ලැබේ.

## 7. කළමනාකරණ සහකාර තනතුර – III ශ්‍රේණිය (තාක්ෂණික නොවන)

**සුදුසුකම්:**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, සිංහල/ දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත් වී තිබීම

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය .

**වැටුප් පරිමාණය:**

MA 1-2 රු.(46,220 – 10 x 540 – 7 x 630 – 12 x 1,080 – 12 x 1,280 – 84,350)

*MA 1-2 පියවර 01 හි (රු.46,220/-) තබනු ලැබේ.

## 8. කාර්මික ශිල්පී (ශල්‍යාගාර) තනතුර

**සුදුසුකම්:**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් වසර දෙකක (02) ශල්‍යාගාර කාර්මික ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම

සහ

II. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම

හෝ

III. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන වසර දෙකක (02) ශල්‍යාගාර කාර්මික පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම

සහ

IV. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම

හෝ

V. ශ්‍රී ලංකා යුධ හමුදා වෛද්‍ය බලකාය, සෞඛ්‍ය අමාත්‍යාංශය හා නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය විසින් මෙහෙයවන ලද වසර දෙකක (02) පූර්ණ කාලීන ශල්‍යාගාර කාර්මික ශිල්පී සහතික පත්‍ර පාඨමාලාව හදාරා තිබීම

සහ

VI. ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම

හෝ

VII. තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 3 රු. (43,280 - 10 × 490 - 10 × 540 - 10 × 590 - 12 × 630 - 67,040)

*PL 3 පියවර 01 හි (රු.43,280/-) තබනු ලැබේ.

## 9. මධ්‍ය වන්ධ්‍යකෘත ඒකක ක්‍රියාකරු තනතුර

**සුදුසුකම්:**

I. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථයන් තුනක් (03) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම

හෝ

II. තනතුරෙහි කාර්යභාරයට අදාළ වන යන්ත්‍ර/ සූත්‍ර ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්මික පුහුණුව සහිත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification - NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 2 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060)

*PL 2 පියවර 01 හි (රු.42,300/-) තබනු ලැබේ.

## 10. දන්ත සහායක තනතුර

**සුදුසුකම්:**

I. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව ඔිනෑම විෂයයන් හයක් සමත් වී තිබීම

හෝ

II. තනතුරෙහි කාර්යභාරයට අදාළ විෂය යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

III. අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 2 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060)

*PL 2 පියවර 01 හි (රු.42,300/-) තබනු ලැබේ.

## 11. විද්‍යාගාර සහායක තනතුර

**සුදුසුකම්:**

I. විද්‍යාගාර සහායක තනතුරෙහි කාර්යභාරයට අදාළ විෂය යටතේ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාව (National Vocational Qualification) දෙවැනි (02) මට්ටමට (NVQ 02) නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

හෝ

II. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 2 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060)
*PL 2 පියවර 01 හි (රු.42,300/-) තබනු ලැබේ.

## පොදු කොන්දේසි

සෑම අයදුම්කරුවෙකුම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම සෑම අපේක්ෂක/ අපේක්ෂිකාවක්ම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලෙහි තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම් කරනු ලබන තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5. සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවා නියුක්තිකයාගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරණ අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරණු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මඟින් කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව)

6. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ජායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2026.07.19** දින හෝ එම දිනට පෙර **"විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"** යන ලිපිනයට යොමු කළ යුතු අතර ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

7. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

8. ඉහත තනතුරු සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුර සඳහා පමණක් ලිඛිත තරග විභාගයක් පවත්වා එමගින් ලබා ගන්නා ලකුණු අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි.

9. අසම්පූර්ණ හෝ ප්‍රමාද වී යොමු කරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න. www.kdu.ac.lk / දුරකථන අංකය – 011 - 2044555.

**www.kdu.ac.lk**